අයවැය චක්‍රලේඛ අංක : 124

මගේ අංකය:- බීඩී/965/1/430
ජාතික අයවැය දෙපාර්තමේන්තුව,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.

2005 දෙසැ. 14

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
හා පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් වෙත.

## නව අමාත්‍ය මණ්ඩලය ස්ථාපනය කිරීම සහ අමාත්‍යාංශවලට දෙපාර්තමේන්තු, විෂයයන් සහ කාර්යයන් වෙන් කොට දීම - මුදල් ප්‍රතිපාදනය සහ ගිණුම්කරණය පිළිබඳ කාර්ය පටිපාටි

අතිගරු ජනාධිපති තුමා විසින් ප්‍රකාශයට පත් කර ඇති 2005.12.08 දිනැති අංක: 1422/22 දරණ අති විශේෂ ගැසට් නිවේදන පරිදි නව අමාත්‍ය මණ්ඩලය ස්ථාපනය කොට ඇත. එම නිසා 2004 අංක: 15 දරණ විසර්ජන පනත මගින් 2005 මුදල් වර්ෂය තුළදී සේවාවන් සැපයීම සඳහා එවකට පැවති අමාත්‍යාංශ යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇති ප්‍රතිපාදන ඉහත ගැසට් නිවේදනය පරිදි නව අමාත්‍යාංශ වෙත යලි වෙන් කර දිය යුතුවේ. නව අමාත්‍යාංශ වෙත වැය ශීර්ෂ වෙන් කර දී ඇති ආකාරය මේ සමඟ අමුණා ඇති I වන උපලේඛනයේ දැක්වෙන අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් උපදෙස් පිළිපදින ලෙස ඔබගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

(අ) පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2004 අංක: 15 දරණ විසර්ජන පනත පරිදි වැය ශීර්ෂ අංක සහ පෙර පැවති අමාත්‍යාංශ, I වන උපලේඛනයේ 1 හා 2 තීරුවල දැක්වේ.

(ආ) 2005.12.08 දිනැති අංක: 1422/22 දරණ අති විශේෂ ගැසට් නිවේදනය පරිදි නව අමාත්‍යාංශ සඳහා වෙන් කර දෙනු ලබන වැය ශීර්ෂ අංක 3 තීරුවෙහි ද නව අමාත්‍යාංශවල නම් 4 වන තීරුවෙහි ද දැක්වේ.

(ඇ) එක් එක් නව අමාත්‍යාංශවලට අදාළ නොවන ප්‍රතිපාදන 5 තීරුවෙහි දැක්වේ. මු.රෙ. 208 පරිදි මෙම ප්‍රතිපාදන 4 වන තීරුවේ නම් සඳහන් අමාත්‍යාංශ විසින් 6 තීරුවේ දැක්වෙන අදාළ අමාත්‍යාංශවලට ලබා දිය යුතුවේ. මෙලෙස ලබා දෙන ප්‍රතිපාදන සම්බන්ධයෙන් අංක 228 හා 449 දරණ මුදල් රෙගුලාසි යටතේ දැක්වෙන ක්‍රියා පටිපාටි අනුගමනය කළ යුතුවේ.

### 1. ගිණුම්කරණ කාර්ය පටිපාටිය :

3 වන තීරුවෙහි දැක්වෙන, යලි වෙන් කොට දී ඇති ශීර්ෂ අනුව වියදම් ගිණුම් තැබීම කළ යුතුය. කිසියම් නව අමාත්‍යාංශයක් සඳහා ශීර්ෂ දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ලබා දී ඇත්නම්, ගිණුම්ගත කිරීම් කළ යුත්තේ නව අමාත්‍යාංශ සඳහා වෙන් කොට දී ඇති ශීර්ෂ අංකයන් පරිදි එම ශීර්ෂ වෙන් වෙන් ශීර්ෂ ලෙස සළකමිනි. ඒ අනුරූපීම එක් එක් ශීර්ෂය වෙනුවෙන් වෙන් වෙන්ව විසර්ජන ගිණුම් සකස් කළ යුතුය.

### 2. අත්තිකාරම් ගිණුම් :

ඇස්තමේන්තුවල එක් එක් ශීර්ෂ යටතේ දැක්වෙන අත්තිකාරම් ගිණුම් මෙහි II වන උපලේඛනයේ දැක්වෙන පරිදි නව අමාත්‍යාංශවලට වෙන් කර දෙනු ලබන අතර එම අත්තිකාරම් ගිණුම් ඒ අනුරූපීම ගිණුම්කරණ කාර්ය පටිපාටියෙහි උපදෙස් පරිදි පවත්වා ගෙන යා යුතුය. මෙහි II උපලේඛණයෙහි නව අමාත්‍යාංශවලට අත්තිකාරම් ගිණුම් අංකයක් පවරා නොමැති නම් එම අමාත්‍යාංශ වල නිලධාරීන් තමන් පෙර සේවය කළ අමාත්‍යාංශයේ අත්තිකාරම් ගිණුම, II උපලේඛණය අනුව පවරා ඇති නව අමාත්‍යාංශ වලින් ණය සහ අත්තිකාරම් ලබා ගත යුතු අතර, බේරුම්කිරීම් එම අමාත්‍යාංශ වලටම සිදු කළ යුතුය. නව අමාත්‍යාංශ වලට මාරු කර ඇති නිලධාරීන්ගේ 2005.12.31 දිනට ණය ශේෂ 2006.01.01වෙනි දින, අයවැය චක්‍රලේඛ 118 උපදෙස් අනුව පැවරිය යුතුය.

3. වැය ශීර්ෂ වෙන් කරනු නොලැබූ අමාත්‍යාංශ :

නම් අමාත්‍යාංශ වෙත පැවරී ඇති වැඩසටහන් ව්‍යාපෘති හා කාර්යයන් සම්බන්ධයෙන් වූ වියදම් දැරීම පිළිබඳ උපදෙස්, වැය ශීර්ෂ වෙන් කරනු නොලැබූ අමාත්‍යාංශයන්හි ලේකම්වරුන් වෙත වෙන වෙනම දන්වනු ඇත.

4. දෙපාර්තමේන්තු :

පවත්නා දෙපාර්තමේන්තුවක් එක් අමාත්‍යාංශයකින් වෙනත් අමාත්‍යාංශයකට මාරු කර ඇති විට, එම දෙපාර්තමේන්තුවට අදාල සියළු වියදම් දැනටමත් ඒ සඳහා වෙන් කොට දී ඇති ශීර්ෂ අංකය යටතේම ගිණුම්ගත කිරීම අඛණ්ඩව සිදු කළ යුතුය. එවැනි දෙපාර්තමේන්තුවක් සඳහා ප්‍රධාන ගිණුම් නිලධාරියා වන්නේ එම දෙපාර්තමේන්තුව දැන් ස්ථාන ගත කොට ඇති අමාත්‍යාංශයේ ලේකම්වරයාය.

5. අමාත්‍යාංශවල සේවක සංඛ්‍යා:

අමාත්‍යාංශ අතර විෂයයන් සහ කාර්යයන් යළි බෙදා හැරීමට අනුකූල වන පරිදි, දැනට සේවයේ නියුක්ත සේවක පිරිස් අමාත්‍යාංශ අතර යළි බෙදා හැරිය යුතුය. තවදුරටත් සේවය සඳහා අවශ්‍ය නොවන සේවක පිරිස් හඳුනා ගෙන සුදුසු පරිදි යළි ස්ථානගත කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට මාරු කළ යුතුවේ.

6. පොදු :

යම් නිශ්චිත අමාත්‍යාංශයක් යටතට නොවැටෙන එහෙත් මෙයට අමුණා ඇති උපලේඛනයේ යළි ප්‍රතිපාදන වෙන් කරදීම සඳහා හඳුනා නොගත් ව්‍යාපෘති සහ කාර්යයන් වේනොත් එවැනි ව්‍යාපෘති සහ කාර්යයන් සඳහා වූ අයවැය ප්‍රතිපාදන, මා වෙතද දන්වමින්, මු.රෙ. 208 යටතේ අදාළ අමාත්‍යාංශයට වෙන් කර දෙන ලෙස එම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

තවද, මෙම චක්‍රලේඛයෙන් පවරා ඇති වැය ශීර්ෂ විස්තරවලට පරිබාහිර වියදම් සඳහා ඉදිරි කාලය තුළදී අවශ්‍ය වන වියදම්, හැකිතාක් දුරට එම විෂයයන් මෙයට පෙර භාරව තිබූ අමාත්‍යාංශවල, දැනට ඉතිරිව ඇති ප්‍රතිපාදන මගින් ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් දන්වා යවනු ලැබේ.

7. පැහැදිලි කිරීම් :

ඔබට නියයම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම්, ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව/ ව්‍යවස්ථාපිත මණ්ඩලය පිළිබඳව කටයුතු කරන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් විමසා කටයුතු කළ හැකිය. එසේම මෙම චක්‍රලේඛයේ උපලේඛන II සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ද විමසා කටයුතු කළ හැකිය.

එස්.බී.දිවාරත්න
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්